2022 මාර්තු 31 වන දිනෙන්
අවසන් වූ මුදල් වර්ෂය සඳහා
බී සී සී ලංකා ලිමිටඩ්
වාර්ෂික වාර්තාව

පටුන

01. ආයතනික තොරතුරු **2**

02. අපගේ දැක්ම හා මෙහෙවර..... **3**

03. සභාපතිවරයාගේ සමාලෝචනය.....**4**

04. අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව..... **5-6**

05. සංවිධානය පිළිබඳව..... **7**

06. විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව.....**8-11**

07. ස්වාධීන විගණක වාර්තාව.....**12-19**

08. මූල්‍ය වාර්තාව

ආදායම් ප්‍රකාශය **20**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය **21**

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය **22**

මුදල් ප්‍රවාහය..... **23**

මූල්‍ය තොරතුරු සඳහා වූ සටහන්.....**24-43**

<u>බී සී සී ලංකා සමාගම- පී බී 221</u>

<u>ආයතනික තොරතුරු</u>

සමාගමේ නම	-	බී සී සී ලංකා සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය	-	පී බී 221
සමාගම පිහිටුවීම	-	1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ 1988.11.04 වන දින බී සී සී ලංකා ලිමිටඩ් යන නාමයෙන් පොදු සමාගමක් ලෙස සංස්ථාගත කර ඇත.
ලියාපදිංචි කාර්යාලය	-	හල්ස්ඩොෆ් මිල්ස්, නො.21, මිරානියා වීදිය, කොළඹ -12.
ව්‍යාපාරික ලිපිනය	-	හල්ස්ඩොෆ් මිල්ස්, නො.21, මිරාණියා වීදිය, කොළඹ 12. දුරකථන අංක: 011-2422111-5 විද්‍යුත් තැපැල් ලිපිනය:bcclankaltd@gmail.com
අධ්‍යක්ෂක මණ්ඩලය	-	2023 පෙබරවාරි 09 වන දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඩී.පී. ද කැම්ස් මහතා - සභාපති ඩබ්.එස්.ආර්.ජේ.කුමාර මහතා එන්.කේ.ඒ.ජී නාරගල මහතා ඒ.එච්.එම් අස්මින් මහතා ඩී.එම්.එස්.පී දයානන්ද මහතා කේ.ටී.එස්.චන්ද්‍රසිරි මහතා එන්.ඩී.එම්.ජේ. විජේසේන මහතා
සමාගම් ලේකම්වරු	-	එස් එස් පී කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම, අංක 101,ඇතුළත මල් පාර, කොළඹ-03.
විගණකවරු	-	ජාතික විගණන කාර්යාලය

අපගේ දැක්ම

“ශත වර්ෂ ගණනාවක් මුළුල්ලේ පැවතෙන සම්ප්‍රදායන් රැකගනිමින් තිරසාරව සංවර්ධිත, සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ අනාගතම වෙළඳ සන්නාමය බවට පත්වීම”

අපගේ මෙහෙවර

“තිරසර පරිසරය, හරයාත්මක වටිනාකම් හා සේවක තෘප්තිමත්භාවය පවත්වාගනිමින් පාරිභෝගිකයාගේ තෘප්තිමත්භාවය සපුරාලීම ”

බීසීසී ලංකා ලිමිටඩ්

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

සභාපතිවරයාගේ සමාලෝචනය

සභාපතිවරයාගේ ප්‍රකාශය

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බීසීසී ලංකා සමාගමේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

සමාගම විසින් රු.මිලියන 122.96ක සුපිරි ලාභයක් වාර්තාකර ඇති අතර, පෙර වර්ෂයේ ලාභය සමඟ සංසන්දනය කිරීමේ දී මෙය තුන් ගුණයකින් පමණ ඉහළ යෑමකි. එමෙන්ම, මෑත කාලීනව වාර්තා වූ ඉහළම අලෙවි ආදායම ද මෙම වර්ෂය තුළ වාර්තාකර ඇති අතර රු.මිලියන 825ක අලෙවි ආදායමක් මෙම වර්ෂය තුළ දී ලබා තිබේ. එය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී 170%ක ඉහළ යෑමකි.

මෙම සියලු ජයග්‍රහණයන් සාක්ෂාත් කරගැනීම සඳහා සිය නොමසුරු සහාය ලබාදුන් අවංක හා කැපවීමෙන් කටයුතුකරන කාර්ය මණ්ඩලයට මේ අවස්ථාවේ දී මාගේ ප්‍රණාමය පුද කරමි. මෙම කාර්යසාධනය අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ සමස්ත කණ්ඩායමේ දිගුකාලීන දැඩි පරිශ්‍රමයේ ප්‍රතිඵලයකි.

කර්මාන්ත අමාත්‍ය ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා සහ ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ගරු චාමර සම්පත් දසනායක මහතා වෙතින් ලැබුණු නොමසුරු සහාය හා නැණවත් මඟ පෙන්වීම සම්බන්ධයෙන් ද මාගේ විශේෂ කෘතඥතාවය පළ කරමි. එසේම, ආයතනික ප්‍රමිතීන් ඉහළ නංවා ගැනීමට හා ඉලක්ක ළඟාකර ගැනීම සඳහා සිය නිරන්තර හා සුවිශේෂී සහයෝගය ලබාදුන් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරය වෙත ද මාගේ කෘතඥතාවය පළකර සිටිමි.

දයාන් ද කැමීස්
සභාපති
බීසීසී ලංකා සමාගම

බීසීසී ලංකා ලිමිටඩ් – පීබී 221
සමාගමේ කටයුතු පිළිබඳව
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

බීබීසී ලංකා සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

වර්ෂය සඳහා ප්‍රතිඵල

මූල්‍ය වර්ෂය තුළ මෙහෙයුම් ලාභය රු.124,377,082.00 ක් විය. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සමාගමේ බදු පෙර ලාභය රු.124,752,054.00 කි. සමාගම විසින් රු. 122,962,200.00 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.100,000,000/- කි. රු.10,000,000/- ක් වන සමාගමේ සාමාන්‍ය කොටස් හිමිකමෙන් 100%ක අයිතිය දරනුයේ භාණ්ඩාගාර ලේකම් විසිනි.

අධ්‍යක්ෂ මණ්ඩලය

2021 අප්‍රේල් 01 වන දින සිට 2022 මාර්තු 31 වන දින දක්වා කාල සීමාව සඳහා බීසීසී ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය;

ඩබ්.එම්.එස්.සී.වෙල්ගම මහතා - 2023.01.09 වන දිනෙන් අධ්‍යක්ෂ/ සභාපති ධුරය අවසන් විය.

කේ.ඒ.සී.ප්‍රියදර්ශනී මෙය - 2022.03.02 වන දිනෙන් අධ්‍යක්ෂ ධුරය අවසන් විය.

පී.බී.ආර්.කුමාර මහතා - 2022.10.26 වන දිනෙන් අධ්‍යක්ෂ ධුරය අවසන් විය.

බී.එන්.ඩී.ගුණසේකර මහතා - 2022.11.16 වන දිනෙන් අධ්‍යක්ෂ ධුරය අවසන් විය.

ජී.ආර්.එම්.එල්.බණ්ඩාර මහතා - 2022.11.16 වන දිනෙන් අධ්‍යක්ෂ ධුරය අවසන් විය.

එම්.පී.ඩබ්.කරුණාරත්න මහතා - 2022.11.16 වන දිනෙන් අධ්‍යක්ෂ ධුරය අවසන් විය.

කේ.බී.ජී.එස්.විමුක්ති මහතා - 2022.12.22 වන දිනෙන් අධ්‍යක්ෂ ධුරය අවසන් විය

අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් සබඳතා

අධ්‍යක්ෂවරු විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 192 වගන්තියට අනුකූල වී තිබේ.

විගණකවරු

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ප්‍රකාරව, විගණකාධිපතිවරයා මෙම සමාගමේ විගණක ලෙස අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

සමාගම් ලේකම්වරු

එස් එස් පී කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම තවදුරටත් මෙම සමාගමේ සමාගම් ලේකම්වරු ලෙස කටයුතු කරනු ලැබේ.

<u>ලියාපදිංචි කාර්යාලය</u>

කොළඹ 12, මිරානියා වීදියේ, අංක 21, හල්ස්ඩෝප් මිල්ස් දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා තිබේ.

S S P CORPORATE SERVICES (PRIVATE) LIMITED

Secretaries

.....	.....	.....
දයාන් ද කැමිස්	අධ්‍යක්ෂ	එස් එස් පී කෝපරේට් සර්විසස්
සභාපති		(පුද්ගලික) සමාගම
		ලේකම්වරු

2023.02.09
A:/d rep-21 - 22

බීසීසී ලංකා ලිමිටඩ්

බීසීසී ලංකා සමාගමේ ප්‍රධාන නිෂ්පාදන පහසුකම් යටතට සබන් කර්මාන්ත ශාලාව හා පොල්තෙල් පිරිපහදුව අයත් වේ. මේවායේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

1. සබන් කර්මාන්තශාලාව

රෙදි සෝදන සබන්, ශරීරයේ ගල්වන සබන් සහ විෂබීජ නාශක හා පවිත්‍රකාරක, මෙම සබන් කර්මාන්තශාලාවෙහි නිෂ්පාදනය කෙරේ. එම නිෂ්පාදන ඒවායේ වෙළඳ සන්නාමයන් සමඟ පහත දැක්වේ.

1) ශරීරයේ ගල්වන සබන් – සඳුන්
සුවේන්ද්‍රා මල් සුවඳැති
සුවේන්ද්‍රා හර්බල්
හෙල්ත්ජෝයි

2) රෙදි සෝදන සබන් – සවරින් බාර්
ස්නෝ වයිට්

3) විෂබීජ නාශක – පයිනෝල්
වැසිකිළි බඳුන් පිරිසිදුකාරක

4) පවිත්‍රකාරක – පිහන් සෝදන දියර
පිහන් සෝදන කුඩු
ස්නෝ වයිට් කෙයාර් පවිත්‍රකාරක දියරය

5) එයාර් ෆ්‍රෙෂ්නර්

2. පිරිපහදු නිෂ්පාදන

සුදු පොල් තෙල් හා කුක්ස් ජෝයි යන වෙළඳ සන්නාම යටතේ මෙම පිරිපහදුවේ පොල් තෙල් නිෂ්පාදනය කෙරේ. පහත සඳහන් ඇසුරුම් ධාරිතාවලින් මෙම නිෂ්පාදන අලෙවි කෙරේ.

කුක්ස් ජෝයි - මිලි ලීටර් 500, ලීටර් 01, ලීටර්05, ලීටර්20

සුදු පොල් තෙල් - මිලි ලීටර් 500,ලීටර්01, ලීටර්05, ලීටර්20

විගණන කමිටු වාර්තාව 2021/2022

බීසීසී ලංකා සමාගමේ විගණන කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වන අතර ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී සිදුකළ යුතු නිරවද්‍ය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට මෙම කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබාදෙනු ලැබේ. ගතික ව්‍යාපාරික පරිසරය තුළ පවත්නා ගැටලු හා අභියෝගවලට විසඳුම් සෙවීමට සහාය ලබාදීමේ අරමුණින් නිරීක්ෂණ හා නිර්දේශ සමඟින් වන විගණන කමිටු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. එමෙන්ම, විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගැනීම තහවුරු කිරීමට හා විභව්‍ය අවදානම් අවම කරගැනීම සඳහා ද කමිටුව විසින් සහාය ලබාදෙනු ලැබේ.

කාර්යභාරය හා වගකීම්

2021 වර්ෂයේ දී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන්හි ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශ මගින් බීසීසී ලංකා සමාගමේ විගණන කමිටුවේ විෂය පථය හා වගකීම් පාලනය වේ. යථොක්ත මාර්ගෝපදේශවලට අනුකූලව විගණන කමිටුවේ විෂය පථය පහත පරිදි දැක්විය හැක.

අ) මූල්‍ය වාර්තාකරණය

- සංකීර්ණ හෝ අසාමාන්‍ය ගනුදෙනු, ඉහළ මට්ටමේ විනිශ්චයන් අවශ්‍ය කෙරෙන ක්ෂේත්‍ර ද ඇතුළුව සුවිශේෂී ගිණුම්කරණ හා වාර්තාකකරණ ගැටලු සහ මෑත කාලීන වෘත්තීමය හා නියාමන ප්‍රකාශයට පත්කිරීම් සමාලෝචනය කිරීම හා මූල්‍ය ප්‍රකාශන මත ඒවායේ බලපෑම අවබෝධ කරගැනීම.
- මුහුණපෑමට සිදුවූ අසීරුතා වෙතොත් ඒවා ද ඇතුළුව විගණනයේ ප්‍රතිඵල, කළමනාකාරිත්වය හා බාහිර විගණකවරු සමඟ සමාලෝචනය කිරීම.
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, සහ ඒවා සම්පූර්ණ ද සහ කමිටු සාමාජිකයන් විසින් දැනුවත් පරිදි ඒවා සැකසිය යුතු ආකෘතියට අනුකූල ද යන්න සහ නියමිත ගිණුම්කරණ ප්‍රමිතීන් හා ප්‍රතිපත්තිවලට අනුකූලව තොරතුරු ඉදිරිපත් කර ඇති බවට තහවුරු කිරීම.
- වාර්ෂික වාර්තාව නිකුත් කිරීමට පෙර එහි අනෙකුත් කොටස් සහ ආශ්‍රිත නියාමන ගොනු සමාලෝචනය කිරීම හා තොරතුරුවල නිරවද්‍යතාවය හා පරිපූර්ණබව කෙරෙහි අවධානය යොමුකිරීම.
- විගණන කමිටුව වෙත යොමුකළ යුතු සියලු කරුණු කමිටුව වෙත ලැබී ඇති බවට කළමනාකාරිත්වය හා බාහිර විගණකවරු සමඟ සමාලෝචනය කිරීම.
- නියාමන අධිකාරීන් වෙත ගොනුකිරීමට පූර්වයෙන් අතරමැදි මූල්‍ය වාර්තා කළමනාකරිත්වය සමඟ සහ අවශ්‍ය වුවහොත් බාහිර විගණකවරුන් සමඟ ද සමාලෝචනය කිරීම හා කමිටු සාමාජිකයන් විසින් දැනුවත් තොරතුරු අනුව ඒවා සම්පූර්ණ හා අනුකූල ද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම.
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව කළමනාකරිත්වය සහ/ හෝ ස්වාධීන විගණකවරු විසින් මතුකර ඇති සුවිශේෂී මූල්‍ය වාර්තාකරණ ගැටලු, සිදුකර ඇති විනිශ්චයන් හා ප්‍රධාන විගණන ගැටලුවලට අදාළව ඔවුන් විසින් පිළියෙල කළ වාර්තා සමාලෝචනය කිරීම.

ආ) අභ්‍යන්තර විගණනය

- වාර්ෂික විගණන සැලැස්ම හා සැලසුමට අදාළ සියලු ප්‍රධාන වෙනස්කම් අනුමත කිරීම.

- අභ්‍යන්තර විගණන විෂය පථය තුළ සාධාරණීකරණය කළ නොහැකි සීමා කිරීම් නොමැතිබවට තහවුරු කිරීම
- සැලසුමට අනුකූලව අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්යයන්හි ඵලදායිතාවය සමාලෝචනය කිරීම.
- තොරතුරු තාක්ෂණයට අදාළව ආරක්ෂාව හා පාලනය ද ඇතුළුව අස්තිත්වයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිතාවය පිළිබඳව අවධානය යොමු කිරීම.
- අභ්‍යන්තර විගණකවරුන්ගේ ඵලදායිතාවය, අපක්ෂපාතිත්වය, අභ්‍යන්තර විගණන කාර්යය තුළින් නියමිත කාලන්තරවලදී වාර්තා ලැබීම හා රජය සතු ව්‍යවසායක් සතුව, පරිපාලිත සමාගම් තිබෙනම් ඒවාට අදාළ ගැටලු විසඳීම යනාදිය නියමිත කාලාන්තරවල දී අධීක්ෂණය කිරීම.
- අභ්‍යන්තර ගැටලු සමාලෝචනය ඔස්සේ අභ්‍යන්තර විගණකගේ විෂය පථය තහවුරු කිරීම.
- ප්‍රසම්පාදන පටිපාටිය හා ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.

ඇ) අවදානම් කළමනාකරණය

වෙනම අවදානම් කමිටුවක් පත්කර නොමැති නම්, රජය සතු ව්‍යවසායේ අවදානම් කළමනාකරණ රාමුව විගණන කමිටුව විසින් සමාලෝචනය කළ යුතු ය. අවාදනම් කාර්යය සම්බන්ධ විෂය පථයට පහත කරුණු ඇතුළත් විය හැක;

- රජය සතු ව්‍යවසායේ නෛතික හා නියාමන පසුබිම, සාර්ව-ආර්ථික ගතිකත්වයන් යනාදිය සැලකිල්ලට ගෙන රජය සතු ව්‍යවසායේ අවදානම් පැහිකඩ හඳුනාගැනීම, ඇගයීම හා තක්සේරු කිරීම සිදුකිරීම;
- අවදානම් ශ්‍රේණිගත කිරීමේ යාන්ත්‍රණයක් ඇතුළුව අවදානම් කළමනාකරණ රාමුව හා අභ්‍යන්තර පාලන පද්ධතිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම;
- අවදානම් අවම කිරීම සඳහා ක්‍රමෝපාය නිර්දේශ කිරීම;
- ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර වාර්තාකරණය සහ කළමනාකරණය සඳහා රජය සතු ව්‍යවසායේ අභ්‍යන්තර ක්‍රියාවලියේ ප්‍රමාණවත්බව පරීක්ෂා කිරීම හා නිර්ණය කිරීම.

ඈ) බාහිර විගණකවරු සමඟ සබඳතාවය

- මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳව බාහිර විගණකවරුන්ගේ සමාලෝචනයේ විෂය පථය අවබෝධකර ගැනීම සහ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර ද සමඟ සුවිශේෂී අනාවරණය කිරීම් හා නිර්දේශ ඇතුළත් වාර්තා ලබාගැනීම.
- කමිටුව හෝ විගණකවරු විසින් වෙන්ව සාකච්ඡා කළ යුතුයැයි සිතන ගැටලු වේ නම් ඒවා සාකච්ඡා කිරීම සඳහා බාහිර විගණකවරු සමඟ නිසි කාලාන්තර තුළ දී වෙනම හමුවිය යුතු ය.

ඉ) අනුකූලතාවය

- නීති හා රෙගුලාසි, නියෝග සමඟ අනුකූලතාවය අධීක්ෂණය සඳහා පද්ධතියේ ඵලදායිතාවය සහ අනුකූල නොවන අවස්ථාවලදී කළමනාකාරිත්වයේ විමර්ශනවල හා පසු විපරම්වල (විනයානුකූල පියවර ද ඇතුළුව) ප්‍රතිඵල සමාලෝචනය කිරීම.
- නියාමන අධිකාරීන් විසින් සිදුකළ යම් පරීක්ෂණවල අනාවරණය කර ගැනීම්, සහ විගණකවරුන්ගේ යම් නිරීක්ෂණ සමාලෝචනය කිරීම.
- අස්තිත්වයේ කාර්ය මණ්ඩලය වෙත චර්යා ධර්ම සංග්‍රහය සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා ඒ සඳහා අනුකූලතාවය අධීක්ෂණය කිරීම.

- කළමනාකාරිත්වයෙන් හා නීති උපදේශක වෙතින් අනුකූලතා කරුණු සම්බන්ධයෙන් නියමිත කාලාන්තරවලදී යාවත්කාලීන තොරතුරු ලබාගැනීම.
- සේවක අර්ථසාධක අරමුදල, සේවකභාරකාර අරමුදල, බදු, රේගු බදු, විදේශ විනිමය අනුපාතික, හා අස්තිත්වය සඳහා අදාළ වන අනෙකුත් බදු ඇතුළුව ව්‍යවස්ථාපිත බැඳීම්වලට අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ක්‍රියාවලියක් ස්ථාපනය කිරීම.

කමිටුවේ සංයුතිය

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන කමිටුවේ සාමාජිකයන් වශයෙන් කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වනුයේ කේ.ඒ.සී.ප්‍රියදර්ශනී මෙය (2022.03.02 දක්වා සභාපති වශයෙන් කටයුතු කරන ලදී), ඩබ්.එස්.ආර්.ජගත් කුමාර මහතා (2022.03.02 වන දින සිට සභාපති වශයෙන් කටයුතු කරනු ලැබේ), එම්.පී.ඩබ්.කරුණාරත්න මහතා (සාමාජික/අධ්‍යක්ෂ), කේ.බී.ජී.එස්.විමුක්ති මහතා (සාමාජික/අධ්‍යක්ෂ) ය. නිරීක්ෂකවරු ලෙස ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී උදේනි පෙරේරා මෙය සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක බී.කේ.එම්.ජේ.රොඩ්රිගෝ මෙය, විගණන කමිටුව නියෝජනය කරන ලදී.

විගණන කමිටුවේ කාර්යයන්

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්බව, නිසි කාල සැකසුම හා පැවැත්ම හා ව්‍යාපාරික මෙහෙයුම් සඳහා එහි අනුකූලත්වය, මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත්බව සම්බන්ධයෙන් වගකීම් කමිටුවට පැවරී තිබේ. එසේම, අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සමානුයෝගිතාවය සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගන්නා SLFRS/LKAS ඇතුළු මූල්‍ය වාර්තාකරණ පද්ධතිවලට අනුකූලතාවය ද කමිටුව විසින් සහතික කරනු ලැබේ.

එසේම, විගණන කමිටුව විසින් පසුගිය වර්ෂය තුළ පහත කාර්යයන් ඉටු කරන ලදී.

- සියලු වත්කම් ආරක්ෂා කිරීමට හා මෙහෙයුම් කළමනාකරණයේ විනිවිදබව වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්බව සමාලෝචනය කරන ලදී.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව හා ඒ පිළිබඳ නිරීක්ෂණ සාකච්ඡා කරන ලදී.
- වසර අවසාන මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- වර්ෂය සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සමාලෝචනය කරන ලදී.
- සමාගම විසින් මුහුණ දෙනු ලැබූ ප්‍රධාන උපායමාර්ගික ගැටලු සාකච්ඡා කරන ලදී.
- සබන් නිෂ්පාදන කර්මාන්තශාලාව සඳහා ක්‍රියාවලි ගිණුම් පද්ධතිය යොදා ගැනීම හා ආයතනයේ ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.
- දිගු කාලයක් හිඟහිටි ශේෂ නිරවුල් කිරීමට පියවර ගන්නා ලදී.

රැස්වීම්

යථොක්තව සඳහන් කළ පරිදි කමිටුව වෙත පැවරී ඇති කාර්යයන් සාකච්ඡා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ, විගණන කමිටු රැස්වීම් තුනක් (03) පවත්වා ඇත.

නිගමනය

හඳුනාගත් ගැටලු සම්බන්ධයෙන් සිය අදහස් දැක්වීම් විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, විගණන කමිටුව විසින් නිර්දේශ කළ පරිදි, ඇතැම් ගැටලු විසඳීම සඳහා අභ්‍යන්තර පාලන බලතලසීමා කිරීම් ඇතුළු නිරවද්‍ය කිරීමේ පියවර ගැනීම අවශ්‍ය කෙරේ.

ඩබ්.එස්.ආර්.ජගත් කුමාර
සභාපති
විගණන කමිටුව

මගේ අංකය எனது இல. My No. IMT/A/BCC/FA/2021-22/03

මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 නොවැම්බර්30දින

සභාපති,

බී.සී.සී.ලංකා සමාගම

බී.සී.සී.ලංකා සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්:- 1. ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය
எனது இல.
My No. IMT/A/BCC/FA/2021-22/03 ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 නොවැම්බර් 30 දින

සභාපති

බී.සී.සී.ලංකා සමාගම

බී.සී.සී.ලංකා සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

බී.සී.සී.ලංකා සමාගමේ 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සමාගමේ 2021/22 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2021/22 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2021/22 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2006 වර්ෂයේ දී සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේදී 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30 පරිදි එක් එක් වැටුප් පියවරයන්හි පිහිටුවා වැටුප් ගෙවා තිබුණද අදාල තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් මෙන්ම සේවක මණ්ඩලයද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන නොතිබුණි. 2022 මාර්තු 31 දිනට සමාගමේ ස්ථිර නිලධාරීන් 44 ක් හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 06 දෙනෙකු වශයෙන් නිලධාරීන් 50 දෙනෙකු සේවයේ නියුක්තව සිටි අතර සමාලෝචිත වර්ෂය සඳහා සේවක වැටුප් හා චේතන වශයෙන් රු.34,687,639ක් හා මිනිස් බල සැපයුම මඟින් සේවකයන් 15ත් 29ත් අතර සංඛ්‍යාවක් සමාගමේ රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කරගෙන ඒ සඳහා රු.9,081,507ක් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) බී.සී.සී සමාගමට අයත් අක්කර 12 රූඩ් 3 පර්චස් 8.77ක් වූ භූමි ප්‍රමාණය 2013 වර්ෂයේ දී රු.මිලියන 8,195 කට තක්සේරු කර ඇති අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉඩම් යටතේ දක්වා තිබුණි. 2015 දෙසැම්බර් 17 දිනැති අංක 15/1874/702/010-VII දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2016 අප්‍රේල් 20 දිනැති අංක 16/0597/731/009-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෙම ඉඩමෙන් අක්කර 6ක බිම් කොටසක් කොළඹ අධිකරණ පියස ඉදිකිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ලිඛිතව පවරා දී තිබුනද, අදාල ඉඩම තක්සේරු කර වන්දි ලබා ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගම පිහිටි භූමිය තුළ වර්ග අඩි 111,310කින් යුත් ගබඩා 32ක් හා තෙල් මෙ.ටොන් 3,600ක ධාරිතාවයකින් යුතු තෙල් ටැංකි 4ක් පැවතුණි. මෙම ගබඩා වර්ග අඩියක් රු.55 ක සිට 70ත් අතර මුදලකට කුලියට දී තිබූ අතර වර්ග අඩි 2,864ක් වූ ගබඩාවක් වර්ෂයකට වැඩි කාලයක සිට කුලියට දී නොතිබුණි. ඉහල වාණිජ වටිනාකමකින් යුතු සමාගම් භූමිය තුල

පවතින මෙම ගබඩා නිසි අළුත්වැඩියාවක් සිදු කර නොමැති වීමෙන් මෙසේ අඩු මුදලකට ලබා දීමට සිදුවී තිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) 1985, 2002 හා 2004 යන වර්ෂවලදී පොල් සංවර්ධන අධිකාරියෙන් රු.58,265,037 ක් හා 2003 වර්ෂයේදී කළුබෝවිටියාන තේ සමාගමෙන් රු.10,000,000 ක් වශයෙන් ලබාගත් ණය මුදල සඳහා සමාලෝචිත වර්ෂය වන විට ගෙවිය යුතු පොලිය පිළිවෙලින් රු.57,165,429 ක් හා රු.51,118,341 ක් විය. මෙම මුදල් නිරවුල් කිරීම සඳහා සමාගම විසින් කටයුතු නොකිරීම හේතුවෙන් සෑම වර්ෂයකටම රු.6,747,521ක පොලී මුදලක් ගෙවිය යුතු මුදලට අලුතෙන් එකතු වෙමින් පැවතුණි.

(ආ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු ලෙස රු.4,508,696 ක ශේෂයක් දක්වා තිබුණද ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ගිණුම් අනුව එවැනි ශේෂයක් නොපෙන්වන බැවින් මෙය විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය.

(ඇ) වර්ෂ 10කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.41,532,452ක් වූ ගෙවිය යුතු වරිපනම් බදු, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, භාණ්ඩ හා සේවා බදු ශේෂ හා වෙළඳ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඈ) 2022 මාර්තු 31 දිනට ගැනුම් අත්තිකාරම්, සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු කුලිය හා වෙළඳ ණයගැති ශේෂ පිලිවෙලින් රු.1,420,474ක් රු.5,306,200 ක් හා රු.138,676,697 ක් විය. ඉන් පිලිවෙලින් එකතුව රු.1,420,474ක් රු.1,961,088ක් හා රු.1,167,208ක් වූ ණය ශේෂයන් වර්ෂ 05 ක සිට වර්ෂ 12 ක් අතර පරාසයක සිට අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඉ) සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනටමත් භාවිතයේ පවතින පිරිවැය රු.43,068,294ක් වූ දේපල පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඊ) බී.සී.සී. සමාගම ප්‍රතිෂ්ඨාපනය හා ප්‍රතිව්‍යුහගත කරන වැඩ පිළිවෙල යටතේ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වතුපිටි වල ආයෝජන සැකසුම් කලාපයේ සී/ස කොන්ටිනෙන්ටල් ලංකා (පුද්.) කර්මාන්ත ශාලාව පිහිටා තිබූ අක්කර 03ක වපසරියක් යුක්ත වූ ස්ථානය 2012 මාර්තු 26 දින බී.සී.සී සමාගම වෙත ලබා දී තිබුණි. එසේම 2012 වර්ෂයේ දී සමාගමේ ප්‍රධාන කාර්යාලයේ පැවති සබන් නිෂ්පාදන යන්ත්‍රාගාරයේ යන්ත්‍ර වතුපිටිවල ආයෝජන මණ්ඩල භූමිය වෙත ගෙන ගොස් ස්ථාපනය කර ඇතත් එය සවි කරන ලද දිනයේ සිට විගණිත දිනය වන තෙක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(උ) රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ වාහන 02 ක් හා සමාගම සතු වූ ප්‍රත්‍යාගණනය කල වාහන 03ක් සහ ප්‍රත්‍යාගණනය නොකල ෆෝක් ලිෆ්ට් එකක්ද වර්ෂ 02 ක සිට වර්ෂ 04 ක් අතර කාල පරාසයක සිට ධාවනයට සුදුසු තත්ත්වයේ නොතිබීමෙන් සමාගම් භූමියේ වාහන අංගනයේ ගාල් කර තිබුණු අතර ඒවා එම අමාත්‍යාංශයට භාර දීමට, අපහරණය කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාගමේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය පරීක්ෂාවේදී අපේක්ෂිත ඉලක්කයන් සහ ලඟාකර ගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය පැහැදිලිව හඳුනගත හැකිවන ලෙස ප්‍රගති වාර්තාව සකස් කර නොතිබුණු අතර ක්‍රියාකාරකම් 06 කින් 03 ක්ද සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

බීසීසී ලංකා ලිමිටඩ්
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2022 රු.	2021 රු.
ආදායම	**04**	**825,151,793**	305,525,059
විකුණුම් පිරිවැය	**05**	**(620,525,436)**	(199,894,401)
දළ ලාභය		**204,626,357**	105,630,658
අනෙකුත් මෙහෙයුම් ආදායම්	**06**	**2,919,979**	530,937
පරිපාලන වියදම්	**07**	**(72,059,757)**	(57,449,846)
බෙදාහැරීමේ පිරිවැය	**08**	**(11,109,497)**	(8,431,436)
මෙහෙයුම්වලින් ලද ලාභය		**124,377,082**	40,280,313
මූල්‍ය ආදායම	**10**	**7,457,723**	10,133,153
මූල්‍ය පිරිවැය	**11**	**(7,082,752)**	(6,812,599)
ශුද්ධ මූල්‍ය ආදායම		**374,972**	3,320,554
බදු පෙර ලාභය		**124,752,054**	43,600,867
ආදායම් බදු ප්‍රතිවර්තන/ (පිරිවැය)	**12**	**(1,789,854)**	(2,431,957)
වර්ෂය සඳහා ලාභය		**122,962,200**	41,168,910
අනෙකුත් විස්තීර්ණ ආදායම්/ (පිරිවැය)			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත ආයුගණක ප්‍රතිලාභ/(අලාභ)	**21**	**1,575,720**	(301,870)
විලම්බිත බදු මත ආයුගණක ප්‍රතිලාභ/(අලාභ)	**24**	**4,444,254**	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම/(අලාභය)		**128,982,174**	**40,867,040**

පිටු අංක 13 සිට 24 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අඛණ්ඩ කොටසකි.
වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩු කිරීම් දැක්වේ.

බීසීසී ලංකා ලිමිටඩ්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 මාර්තු 31 වන දිනට	සටහන්	2022 රු.	2021 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	13	**8,221,122,324**	8,206,273,520
විකිණීම සඳහා පවතින - ආයෝජන	14	**240,000**	240,000
විලම්බිත බදු වත්කම්	24	**6,312,460**	-
		8,227,674,784	8,206,513,520
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	15	**59,390,147**	49,318,418
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	16	**162,124,051**	62,240,234
ප්‍රවර්තන බදු වත්කම්	17	**1,733,996**	3,523,850
මුදල් හා මුදල් සමාන දෑ	18	**222,694,390**	204,753,964
		445,942,584	319,836,466
මුළු වත්කම්		**8,673,617,368**	8,526,349,986
හිමිකම් හා වගකීම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	19	**100,000,000**	100,000,000
ප්‍රත්‍යාගණිත සංචිතය	20	**8,215,475,600**	8,193,775,600
රඳවාගත් ඉපැයුම්		**75,278,952**	(53,703,222)
මුළු හිමිකම්		**8,390,754,552**	8,240,072,378
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	21	**11,453,590**	11,718,836
ණය සහ ණය ගැනීම්	22	**176,548,806**	169,801,285
විලම්බිත බදු බැරකම්	24	**1,868,206**	-
		189,870,603	181,520,121
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු	23	**92,992,214**	104,757,486
		92,992,214	104,757,486
මුළු වගකීම්		**282,862,816**	286,277,607
මුළු හිමිකම් හා වගකීම්		**8,673,617,368**	8,526,349,985

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩු කිරීම් දැක්වේ.

සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 12 දක්වා වන අතර පිටු අංක 13 සිට 24 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්වලම අඛණ්ඩ කොටසකි.

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවට සහතික කෙරේ.

එස්.එම්.සී.ඩබ්. රන්ජන්
සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් යොදා ඇත.

ඩබ්.එම්.එස්.සී.වෙල්ගම
සභාපති/ අධ්‍යක්ෂ

එම්.පී.ඩබ්.කරුණාරත්න
අධ්‍යක්ෂ 20/11/2023

කොළඹ.

දිනය: .....

බීසීසී ලංකා ලිමිටඩ්
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	ප්‍රත්‍යාගණිත සංචිතය	රඳවාගත් ඉපැයුම් රු.	මුළු ප්‍රමාණය රු.
2020 අප්‍රේල් 1 දිනට ශේෂය	100,000,000	8,193,775,600	(94,570,262)	8,199,205,338
වසර සඳහා ලාභය	-	-	41,168,910	41,168,910
අනෙකුත් විස්තීර්ණ ආදායම්			(301,870)	(301,870)
2021 අප්‍රේල් 1 දිනට ශේෂය	**100,000,000**	**8,193,775,600**	**(53,703,222)**	**8,240,072,378**
වසර සඳහා ලාභය	-	-	122,962,200	122,962,200
අනෙකුත් විස්තීර්ණ ආදායම්/(වියදම්)			6,019,974	6,019,974
මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කිරීම		21,700,000		21,700,000
2022 මාර්තු 31 දිනට ශේෂය	**100,000,000**	**8,215,475,600**	**75,278,952**	**8,390,754,552**

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩු කිරීම් දැක්වේ.

සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 12 දක්වා වන අතර පිටු අංක 13 සිට 24 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශයන් සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අඛණ්ඩ කොටසකි.

බීසීසී ලංකා ලිමිටඩ්

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	**2022**	2021
		රු.	රු.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන්			
බදු පෙර ලාභය/ (අලාභය)		**124,752,054**	43,600,867
ගැලපීම්			
ක්ෂය කිරීම්	**13**	**8,364,207**	2,711,855
පොලී ආදායම්	**10**	**(7,457,723)**	(10,133,153)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා වෙන්කළ ප්‍රතිපාදන වැඩි කිරීම්	**21**	**2,179,992**	1,985,617
පොළී පිරිවැය	**11**	**6,747,521**	6,747,521
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)		**134,586,051**	44,912,707
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්:			
භාණ්ඩ තොග වැඩිවීම	**15**	**(10,071,729)**	(21,711,811)
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම	**16**	**(99,883,817)**	(422,058)
වෙළඳ සහ අනෙකුත්ගෙවිය යුතු දෑ වැඩිවීම/ (අඩුවීම)	**23**	**(11,765,272)**	4,782,410
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල්		**12,865,232**	27,561,248
විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම්	**21**	**(869,518)**	(426,050)
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල්		**11,995,714**	27,135,198
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම	**13**	**(1,513,021)**	(1,556,226)
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය		**-**	-
ලැබූ පොලිය	**10**	**7,457,723**	10,133,153
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල්/ (භාවිතා කළ)		**5,944,702**	8,576,927
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය			
ගෙවූ රඳවා ගැනීමේ බදු		**-**	-
ගෙවූ ආර්ථික සේවා ගාස්තු		**-**	-
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**-**	**-**
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**17,940,426**	35,712,125
වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**18**	**204,753,964**	169,041,839
වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**222,694,390**	204,753,964
වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑවල විශ්ලේෂණය			
මහජන බැංකුව	**18**	**34,721,023**	28,555,689
අතැති මුදල්	**18**	**217,000**	217,000
කෙටි කාලීන ආයෝජන - මහජන බැංකුව	**18**	**187,756,367**	175,981,274
		222,694,390	204,753,963

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩු කිරීම් දැක්වේ.

සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 12 දක්වා වන අතර පිටු අංක 13 සිට 24 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අඛණ්ඩ කොටසකි.

1. වාර්තාකරණ අස්තිත්වය

1.1 නිත්‍ය ව්‍යාපාරික ස්ථානය හා නෛතික තත්ත්වය

බීසීසී ලංකා සමාගම ශ්‍රී ලංකාවේ නිත්‍ය වශයෙන් සංස්ථාපිත සීමාසහිත වගකීම් සහිත සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 12, මීරානියේ වීදියේ, අංක 21හි හල්ස්ඩෝර්ෆ් මිල්ස් යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලට පහත ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

- පොල්තෙල් පෙරීම, ඇසුරුම් කිරීම හා වෙළඳාම
- ඇඟෙහි ගල්වන සබන්, ගෘහස්ත කටයුතු සඳහා සබන්, විෂබීජනාශක හා පවිත්‍රකාරක අවශ්‍ය දෑ නිෂ්පාදනය හා වෙළඳාම
- ගොඩනැගිලි කුලියට දීම

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් සමඟින් 2022 මාර්තු 31 වන දිනට හා එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (‘මූල්‍ය ප්‍රකාශ’), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs සහ LKASs) සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.2 මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ සඳහා අදාළ සටහන්වල පැහැදිලි කර ඇති පරිදි, නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල වර්තමාන අගය මත විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් මිනුම් කිරීමේ දී හැර මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත.

2.3 සංසන්දනාත්මක තොරතුරු

වෙනත් අයුරකින් සඳහන් කර ඇති විටක හැර, සමාගම විසින් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා පූර්ව වර්ෂයේ සංඛ්‍යාත්මක අගයන් හා ප්‍රකාශයන් නැවත සකස්කර තිබේ.

2.4 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනයෙන් පසු සිදු වූ සිද්ධි

සියලුම ප්‍රමාණාත්මක සිද්ධි සලකා බලනු ලබන අතර, යෝග්‍ය ගැලපීම් හෝ අනාවරණය කිරීම් මෙම මූල්‍ය ප්‍රකාශවල සිදුකර ඇත.

2.5 ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශ, සමාගමේ ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර තිබේ. වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් හැර, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයනු ලැබ ඇත.

2.6 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශවල වෙන් වශයෙන් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 1 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' මගින් අවස්ථාව සලසා දී ඇති පරිදි අප්‍රමාණවත්වන්නේ නම් මිස අසමාන ස්වභාවයෙන්හෝ ක්‍රියාකාරීත්වයෙන් යුතු අයිතම වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.7 මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

2022 දෙසැම්බර් මස 31 දිනැති අධ්‍යක්ෂවරුන්ගේ යෝජනා සම්මතයට අනුව 2022 මාර්තු 31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වන සමාගමේ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීම සඳහා බලය පවරා දී තිබේ.

2.8 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වගකීම භාරගන්නා අතර එවැනි වගකීම් යටතට පහත දැ ඇතුළත් වනු ඇත:

සාමලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු

- වසර අවසානයට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු
- මුදල් හා මුදල් සමාන දෑ වල සංචරණය පිළිබඳ තොරතුරු පරිශීලකයන්ට ලබාදීම
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2.9 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

SLFRSs/LKASs වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම හා වාර්තා කර ඇති වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදුකිරීම අවශ්‍ය කෙරේ. සැබෑ ප්‍රතිඵල එම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු හා ඒවාට පාදක වූ උපකල්පන සම්බන්ධයෙන් නිරන්තර පදනමක් මතසමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සිදුකරන සංශෝධන එකී සංශෝධන සිදුකරන කාලසීමාව තුළ දී හා එහි බලපෑම සිදුවන යම් ඉදිරි කාලසීමාවන් වලට අදාළව හඳුනාගනු ලැබේ.

විශේෂයෙන්ම, මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනු ලබන අගයන් සඳහා වැඩිම සුවිශේෂී බලපෑමක් ඇති කරන ඇස්තමේන්තු කිරීමේ දී, ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී අවිනිශ්චිතතාවයක් හා තීරණාත්මක විනිශ්චයන් අදාළ වන සුවිශේෂී වැදගත්කමක් සහිත ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු පහත සටහන්වල දී විස්තර කර තිබේ:

- සේවක විශ්‍රාමික ප්‍රතිලාභ
- දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම
- හානිකරණ සඳහා වෙන් කිරීම්

2.10 අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරීත්වය විසින් තක්සේරුවක් කර ඇති අතර එමගින් ආයතනයේ අපේක්ෂිත අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් පවතින බවට සෑහීමට පත්ව තිබේ. එමෙන්ම, අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන අඛණ්ඩව සූදානම්ව සිටීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කිරීමකට අදාළ කිසිදු සැලකිය යුතු අවිනිශ්චිතතාවයන් පිළිබඳව කළමනාකාරීත්වය දැනුවත්ව නොමැත. එනිසා, සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනමින් නොකඩවා ඉදිරිපත් කෙරේ.

2.11 වාර්තාකරණ දිනයට පසු සිද්ධීන්

වාර්තාකරණ දිනය හා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලැබෙන දිනය අතර සිදුවන වාසිදායක සහ අවාසිදායක සිද්ධීන් වාර්තාකරණ දිනයට පසු සිද්ධීන් වේ. මේ අනුව, වාර්තාකරණ දිනයට පසුව සිදුවන සියලු ප්‍රමාණාත්මක හා වැදගත් සිද්ධීන් සලකා බැලෙන අතර අවශ්‍යතාවය පරිදි යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදුකරනු ලැබේ.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් හැර, සමාගම විසින් මෙම මූල්‍ය ප්‍රකාශවලින් ඉදිරිපත් කරන සියලු කාලසීමාවන් සඳහා අඛණ්ඩවම පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනේ.

3.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1 පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකර පිරිවැයට සඳහන් කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවලට අදාළ සියලු අයිතම ආරම්භයේ දී එහි පිරිවැයට වාර්තා කරනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය යනු වත්කම එහි අපේක්ෂිත පරිහරණ තත්ත්වයට පත්කිරීම සඳහා දරන ලද යම් පිරිවැයක් ඇතොත් එය ද සමඟින් අත්පත් කරගැනීම හෝ ඉදිකිරීම සඳහා දරන ලද පිරිවැය යි.

3.1.2 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණයක සංරචකයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා පසුකාලීනව දරනු ලබන පිරිවැය එකී අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් සමාගම තුළට ලැබීමේ සම්භාවිතාවයක් ඇත්නම් හා එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් පමණි. දේපළ, පිරියත හෝ උපකරණවල එදිනෙදා සේවා කටයුතු සඳහා වන පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

3.1.3 ක්ෂය කිරීම්

වත්කම්වල පිරිවැය (සින්නක්කර ඉඩම් හැර) කපා හැරීම පිණිස සරල මාර්ගික ක්‍රමවේදය භාවිතා කරමින් ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය පුරා ඒවායේ ශේෂ අගයෙන් අඩුකර ක්ෂය කිරීම්, ලාභ හෝ අලාභයට අය කෙරේ. ඇස්තමේන්තුවල සිදුවන යම් වෙනසක් අනාගතයේ දී යොදාගත හැකි පදනමින් ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය, ශේෂ අගය සහ ක්ෂය කිරීමේ ක්‍රමය සෑම වර්ෂයක් අවසානයේ සමාලෝචනය කරනු ලැබේ.දේපළ, පිරියත හෝ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ;

ස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය	**ප්‍රයෝජනවත් ආයු කාලය**
පිරියත හා යන්ත්‍රෝපකරණ	වසර 10
ගොඩනැගිලි	වසර 20
මෙවලම් හා උපකරණ	වසර 04
මෝටර් වාහන	වසර 04
කාර්යාල උපකරණ	වසර 04
ගෘහභාණ්ඩ හා සවිකරීම්	වසර 04

වත්කමක් ක්ෂය වීම එය භාවිතා කිරීම සඳහා පවතින අවස්ථාවේ දී ආරම්භ වන අතර එකී වත්කම විකිණීම සඳහා පවතින හෝ හඳුනාගැනීමෙන් බැහැර කිරීමට වශයෙන් වර්ගීකරණය කිරීම යන දෙකෙන් පළමුව එළඹෙන දිනයේ සිට ක්ෂය කිරීම් අවසන් කෙරේ. ක්ෂය කිරීමේ ක්‍රමවේද, ප්‍රයෝජනවත් ආයු කාලය හා ශේෂ අගය සෑම වාර්තාකරණ දිනයකදී ම සමාලෝචනය කරන අතර අදාළ පරිද්දෙන් ගැලපුම් කරනු ලැබේ.

නිෂ්පාදන හා සේවා අංශ සඳහා පහත දැක්වෙන අනුපාතිකවලින් දේපළ, පිරියත හා උපකරණවල වාර්ෂික ක්ෂයවීම් වෙන් කිරීමට සමාගම විසින් තීරණය කරන ලදී

ස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය	**නිෂ්පාදන අංශය**	**සේවා අංශය**
පිරියත හා යන්ත්‍රෝපකරණ	**70%**	**30%**
ගොඩනැගිලි	40%	60%
මෙවලම් හා උපකරණ	30%	70%
මෝටර් වාහන	-	100%
කාර්යාල උපකරණ		100%
ගෘහභාණ්ඩ හා සවිකරීම්		100%

3.1.4 ණය ගැනුම් පිරිවැය

යම් වත්කමක් එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා යම් සැලකිය යුතු කාලසීමාවක් ගනු ලබයි නම් එම වත්කම අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් සෘජුවම අදාළ වන ණය ගැනුම් පිරිවැය අදාළ වත්කමේ පිරිවැය කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනුම් පිරිවැය ඒවා පැන නැඟුනු කාල සීමාවේ වියදමක් ලෙස සැලකේ.ණය අරමුදල් ලබා ගැනීමේ දී ණය ගැනුම් පිරිවැය පොලිය හා අස්තිත්වය විසින් දරනු ලබන අනෙකුත් පිරිවැයෙන් සමන්විත වේ.

3.1.5 ප්‍රත්‍යාගණනය

සමාගම විසින් එහි ඉඩම සහ ගොඩනැගිලි අවම වශයෙන් වසර පහකට වරක් ප්‍රත්‍යාගණනය කෙරෙන අතර ඉඩම සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනිත දිනයට වන සාධාරණ අගයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අඩු කිරීමෙන් මිනුම් කෙරේ.

3.2 අස්පෘශ්‍ය වත්කම්

3.2.1 හඳුනාගැනීම හා මිනුම්කරණය

අස්තිත්වය තුළට අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වත්කම් තුළින් ගලා ඒම පිළිබඳ භව්‍යතාවයක් තිබේ නම් සහ LKAS 38 - 'අස්පෘශ්‍ය වත්කම්'ට අනුකූලව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනේ. නිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අඩුකර මිනුම් කෙරේ.

3.2.2 පසුකාලීන වියදම්

නිශ්චිත වත්කමකට අදාළව දරනු ලබන පසුකාලීන වියදම එම වත්කම හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කෙරේ නම් පමණක් එය ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අභ්‍යන්තර වශයෙන් ජනනය වූ කීර්ති නාමය සඳහා වැය වූ වියදම් ද ඇතුළුව අනෙකුත් සියලුම වියදම් වැය කරන අවස්ථාවේ දී ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ.

3.2.3 ක්‍රමක්ෂය

කීර්තිනාමය හැරුන විට, අස්පෘශ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය කිරීම ඒවා භාවිතා කරන දිනයේ සිට අපේක්ෂිත ආයු කාලය තුළ සරල මාර්ග ක්‍රමය ඔස්සේ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ.

3.2.4 හඳුනා ගැනීම් බැහැර කිරීම

අස්පෘශ්‍ය වත්කමක් භාවිතයෙන් ඉවත් කිරීමේ දී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොවන විට පසුව බැහැර කිරීමේ දී හඳුනාගැනීම් බැහැර කෙරේ.

3.3 සේවක විශ්‍රාම ප්‍රතිලාභ

3.3.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු සේවා කාලයෙන් අනතුරුව භුක්ති විඳිය හැකි ප්‍රතිලාභ සැලසුමක් (පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමක්) වන අතර මෙහිදී දායකත්වයන් වෙනම අරමුදලකට යැවෙන අතර, අස්තිත්වයට සේවා කාලයෙන් අනතුරුව තවදුරටත් මුදල් ගෙවීමට නීතිමය හෝ සම්මුතික බැඳීමක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුමක් සඳහා දායකත්ව බැඳීම් සේවකයා විසින් සේවය ලබාදෙන කාල පරිච්ඡේදය තුළ සේවක ප්‍රතිලාභ වැයක් ලෙස ලාභ හෝ අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී. නියමිත දිනට පෙර ගෙවන ලද දායකත්වය එහි මුදල් ප්‍රතිගෙවීමක් හෝ ඉදිරි ගෙවීම්වල අඩුවීමක් ලෙස සලකයි නම් එය වත්කමක් ලෙස හඳුනාගැනේ.

3.3.1.1 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සියලුම විධායක කාර්ය මණ්ඩලය හා කාර්යාලීය සේවක මණ්ඩලය බීසීසී කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර, අනෙකුත් සේවකයන් සේවක අර්ථසාධක අරමුදල සඳහා සුදුසුකම් ලබයි. එසේම, සියලුම සේවකයන් සේවක භාරකාර අරමුදලේ සාමාජිකයන් වේ. සමාගම විසින් මෙම අරමුදල් සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 15%ක් හා 3%ක් වශයෙන් සිය දායකත්වය දරයි.

3.3.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් නොවනපශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමකි. අභ්‍යන්තර වශයෙන් ජනනය කළ ක්‍රමවේදයක් භාවිතා කරමින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ගණනය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකට අදාළව සමාගමේ ශුද්ධ බැඳීම සේවකයන් විසින් ඔවුන්ගේ වර්තමාන හා පූර්ව සේවාවන් උදෙසා උපයාගත් අනාගත ප්‍රතිලාභයන් ඇස්තමේන්තුකර ගණනය කෙරේ. අගයවල් නිර්ණය කිරීම සඳහා පාදක කරගත් උපකල්පන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කෙරේ. මෙම වගකීම සඳහා බාහිර වශයෙන් අරමුදල් සම්පාදනය නොවන අතර, ආයුගණක පදනම්න් අගය නොකෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලින් පැන නඟින සියලු ආයුගණක ලාභ සහ පාඩු සමාගම විසින් අනෙකුත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගන්නා අතර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ වියදම් ලාභ හෝ අලාභවල සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගනී.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 19-'සේවක ප්‍රතිලාභ' වලට අනුකූලව, විශ්‍රාමික පාරිතෝෂික සඳහා සියලුම සේවකයන්ගේ සේවයේ පළමු වසරේ සිට ප්‍රතිපාදන වෙන් කෙරේ. එසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, වසර 05ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් අනතුරුව පමණක් සේවකයෙකු සම්බන්ධයෙන් මෙම වගකීම පැන නඟී.

3.4 වෙන් කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සමාගමට විශ්වාසනීය අයුරින් ඇස්තමේන්තුගත කළ හැකි වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳීමක් පවතින විට සහ එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ බැහැරට ගලා යෑමක් විය හැකි විට වෙන්කිරීම් හඳුනාගනී.

3.5 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම

3.5.1 ආදායම් හඳුනාගැනීම්

සමාගම තුළට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමක් සහ ආදායම් හා දැරූ හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය විශ්වසනීය අයුරින් මිනුම්කළ හැකි බවට සම්භාවිතාවයක් පවත්නා දුරට ආදායම් හඳුනාගනී. ගෙවීම් ගිවිසුම්ගත නිශ්චිත නියමයන් යටතේ ලැබූ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට ආදායම මිනුම්කරණය කෙරේ.

3.5.1.1 භාණ්ඩ අලෙවිය

භාණ්ඩවල අයිතිය සම්බන්ධ සුවිශේෂී අවදානම් හා ප්‍රතිලාභයන් ගැනුම්කරු වෙත මාරු වීමේදී, සාමාන්‍යයෙන් භාණ්ඩ යැවීමේ දී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනී.

අයභාරය කොටස්වලට විසුරුවා හැරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 15ට අනුව අයභාරයේ හා මුදල් ප්‍රවාහවල ස්වභාවය, ප්‍රමාණය, කාල නිර්ණය හා අවිනිශ්චිතා කෙරෙහි ආර්ථික සාධක කෙසේ බලපාන්නේ ද යන්න නිරූපණය වන අන්දමට අස්තිත්වයක් විසින්, ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් ලැබූ අයභාරය ප්‍රභේදනය කර කොටස්වලට විසුරුවා හැරිය යුතු ය. පාරිභෝගිකයන් වෙත සැපයූ භාණ්ඩවලින් ලැබූ හා ලැබිය යුතු අයභාරයෙන් සමාගමේ අයභාරය පෙන්නුම්කරන බැවින්, අයභාරය කොටස්වලට විසුරුවා හැරීමක් අවශ්‍ය නොවේ.

3.5.1.2 කුලී ආදායම

කුලී ආදායම එය උපචිත වන පරිද්දෙන් ලාභ හා අලාභවල හඳුනාගනු ලැබේ.

3.5.1.3 මූල්‍ය ආදායම

භාණ්ඩාගාර බිල්පත්වල සිදුකළ ආයෝජනවලින් ලැබූ පොලී ආදායම හා ස්ථාවර තැන්පතු මත පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ. පොලී ආදායම එය උපචිත වනවිට ඵලදායී පොලී ක්‍රමවේදය යටතේ ලාභ හා අලාභවල හඳුනාගනී

3.5.2 වියදම්

වියදම් උපචිත පදනමින් හඳුනාගනී. ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීමට වැය කෙරෙන සියලු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමෙන් අයකරනු ලැබේ.

3.5.2.1 මූල්‍ය වියදම්

ණය ගැනුම් මත පොලී වියදම්වලින් මූල්‍ය පිරිවැය සමන්විත වේ.

3.6 භාණ්ඩ තොග

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට තොග සටහන් කරනු ලැබේ.

මිලදී ගැනුම්වල සියලු පිරිවැය, පිරිවැය පරිවර්තන හා භාණ්ඩ තොග දැනට පවතින ස්ථානයට හා තත්ත්වයට ගෙනඒම සඳහා දරන ලද අනෙකුත් පිරිවැයෙන් භාණ්ඩ තොගවල පිරිවැය සමන්විත වේ.

නිෂ්පාදිත තොග හා දැනට කටයුතු කෙරෙමින් පවතින තොග හැරුනවිට අනෙකුත් සියලු තොග අයිතම පළමු ලැබීම් පළමු නිකුතු ක්‍රමයට මිනුම්කරණය කෙරේ.

3.7 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ විකුණන ලද භාණ්ඩ හෝ ඉටු කරන ලද සේවා සඳහා පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු මුදල් වේ. ලැබිය යුතු මුදල වසරක් තුළ හෝ ඊට අඩු කාල සීමාවක් තුළ දී (හෝ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය තුළ වැඩිකාලයක් පවතී නම්) ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරන අතර, එසේ නොමැති නම් ජංගම නොවන වත්කමක් ලෙස වර්ගීකරණය කෙරේ.

වෙළඳ ලැබිය යුතු දෑ මුල් අවස්ථාවේ දී සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර, ඉන් අනතුරුව ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් හානිකරණ වෙන්කිරීම් අඩුකර මිනුම්කරණය කෙරේ. සමාගම වෙත ලැබිය යුතු සියලු මුදල් මුල් කොන්දේසි අනුව එකතු කරගත නොහැකි බවට විෂය මූලික සාක්ෂි පවතින විට වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකරයි.

ණයගැතියාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණය ගැතියා බංකලොත්බවට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත්වීමේ සම්භාවිතාවය හෝ ගෙවීම් පැහැර හැරීම යනු වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බවට සැලකෙන දර්ශකයන් වේ.

3.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ශේෂ, ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන, සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජනවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.9 බදුකරණය

ආදායම් බදු වියදම් ප්‍රවර්තන සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. ආදායම් බදු එය හිමිකම්වල සෘජුවම හඳුනාගන්නා අයිතමයකට අදාළ නොවන විට ලාභ හෝ අලාභයේ හඳුනාගන්නා අතර, අදාළ වනවිට හිමිකම් හෝ අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගැනේ.

3.9.1 ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු ලෙස හඳුන්වනුයේ බලාත්මක කර තිබූ හෝ වාර්තාකරණ දිනයට බලාත්මක කළ බදු අනුප්‍රමාණ භාවිතාකරමින් වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම මත ගෙවීමට අපේක්ෂිත බදු ගෙවීම යි. පෙර වර්ෂයන්ට අදාළව ගෙවිය යුතු බදුවල යම් ගැලපීමක් වෙතොත් එය ද අදාළ වේ.

බදුකරණය සඳහා වෙන්කිරීම් සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදුකරණ කාර්යය සඳහා ගැලපුම් කළ වර්ෂය සඳහා ලාභය පදනම් වේ.
අදාළ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වල නියමිත සටහන්වලදී අනාවරණය කර තිබේ.

3.9.2 විලම්බිත බදු

මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා සහ බදුකරණ කාර්යයන් සඳහා භාවිතා කරන අගයන් සඳහා වත්කම් හා බැරකම්වල ධාරණ අගයන් අතර තාවකාලික වෙනසට අදාළව විලම්භීත බදු බැරකම් හඳුනාගනී.

3.10. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රමිතියකින් අවසර ලැබෙන්නේ නම් හෝ ප්‍රමිතියකට අදාළව අවශ්‍ය වන්නේ නම් හැර, සංසන්දනාත්මත තොරතුරු පෙර කාල පරිච්ඡේදයට අදාළව හෙළිදරව් කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල අයිතමයක් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කෙරේ නම්, සංසන්දනාත්මක අගයන්, එසේ කිරීම ප්‍රයෝගික නොවන අවස්ථාවන්හි දී හැර අනෙකුත් අවස්ථාවන්හි දී ප්‍රතිවර්ගීකරණය කෙරේ.

3.11. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 7) - 'මුදල් ප්‍රවාහ ප්‍රකාශ'වලට අනුකූලව මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර තිබේ. දන්නා මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකමෙහි වෙනසක් සිදුවීමේ නොසැලකිය හැකි අවදානමකට යටත් කෙටිකාලීන, ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජනවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල්, බැංකුවල ඇති ශේෂ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් ඇතුළත් වේ.

3.12 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මිලක් අය කෙරෙන්නේ ද හෝ නැත් ද යන්න නොසලකා, එක් පාර්ශවයකට අනෙක් පාර්ශවයේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ කෙරෙහි පාලනයක් හෝ සුවිශේෂී බලපෑමක් ඇතිකිරීමට හැකියාවක් පවතින ගනුදෙනු වලට ආදළව හෙළිදරව් කිරීම් සිදුකරනු ලැබේ.

අදාළ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් වල නියමිත සටහන්වලදී හෙළිදරව් කර තිබේ.

3.13 පසුව සිදුවන සිදුවීම්

වාර්තාකරණ කාල සීමාවෙන් පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර තිබේ.

මාර්තු **31** වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		**2022** රු.	2021 රු.
04 ආදායම			
සබන්		**53,366,645**	45,841,540
පිරිපහදුව		**691,848,117**	193,856,378
කුලී ආදායම්		**79,937,031**	65,827,141
		825,151,793	305,525,059
05 **විකුණුම් පිරිවැය**			
05.1	**අප්‍රේල් 01 වන දිනට භාණ්ඩ තොගය**		
	සබන් අංශය	**23,580,117**	19,115,400
	පිරිපහදු අංශය	**25,356,985**	8,109,891
	පීප්ප අංශය	**381,316**	381,316
	උප එකතුව	**49,318,418**	27,606,607
05.2	**මිලදී ගැනුම්**		
	සබන් අංශය	**39,648,755**	38,119,072
	පිරිපහදු අංශය	**574,285,386**	168,232,117
	උප එකතුව	**613,934,140**	206,351,189
05.3	**සෘජු වියදම්**		
	වේතන	**11,153,025**	8,902,151
	සේවක අර්ථසාධක අරමුදල	**554,524**	542,312
	සේවක භාරකාර අරමුදල	**110,905**	108,462
	රසායන ද්‍රව්‍ය	**45,706**	47,602
	උප එකතුව	**11,864,160**	9,600,527
05.4	**නිෂ්පාදන පොදුකාර්යය පිරිවැය**		
	වැටුප්	**1,944,423**	2,301,893
	සේවක අර්ථසාධක අරමුදල	**202,107**	259,340
	සේවක භාරකාර අරමුදල	**40,421**	51,868
	ක්ෂය කිරීම් සටහන 13.2	**1,028,137**	949,166
	විදුලිබලය	**921,905**	1,033,062
	ගොඩනැගිලි හා පරිශ්‍රය නඩත්තු කිරීම - කුලියට දුන් ගොඩනැගිලි	**298,500**	201,600
	යන්ත්‍රෝපකරණ නඩත්තුව	**363,372**	857,567
	උප එකතුව	**4,798,865**	5,654,496
05.5	**මාර්තු 31 වන දිනට තොගය**		
	සබන් අංශය	**20,768,477**	23,580,117
	පිරිපහදු අංශය	**38,240,354**	25,356,985
	පීප්ප අංශය	**381,316**	381,316
	උප එකතුව	**59,390,147**	49,318,418
	විකුණුම් පිරිවැය සාරාංශය		
	අප්‍රේල් 01 වන දිනට භාණ්ඩ තොගය	**49,318,418**	27,606,607
	මිලදී ගැනුම්	**613,934,140**	206,351,189
	සෘජු වියදම්	**11,864,160**	9,600,527
	නිෂ්පාදන පොදු කාර්යය	**4,798,865**	5,654,496
	මාර්තු 31 වන දිනට භාණ්ඩ තොගය	**(59,390,147)**	(49,318,418)
	එකතුව	**620,525,436**	199,894,401

05.6 විකුණුම් පිරිවැය - සබන්, පිරිපහදු හා කුලී

	සබන්	පිරිපහදුව	කුලිය
2021.04.01 දිනට භාණ්ඩ තොගය	23,580,117	25,356,985	-
මිලදී ගැනුම්	39,648,755	574,285,386	-
සෘජු වියදම්			
වේතන	4,472,521	6,680,503	-
සේ.අ.අරමුදල	337,168	217,356	-
සේ.හා.අරමුදල	67,434	43,471	-
රසායන ද්‍රව්‍ය	-	45,706	-
නිෂ්පාදන පොදුකාර්යය			
වැටුප්	1,026,077	918,346	
සේ.අ.අරමුදල	115,776	86,331	
සේ.හා.අරමුදල	23,155	17,266	
ක්ෂය කිරීම්	347,158	347,158	333,821
විදුලිබලය	332,932	588,973	-
යන්ත්‍රෝපකරණ නඩත්තුව	181,686	181,686	-
ගොඩනැගිලි හා පරිශ්‍රය නඩත්තු කිරීම			298,500
2022.03.31 දිනට භාණ්ඩ තොගය	(20,768,477)	(38,240,354)	-
	49,364,301	**570,528,814**	**632,321**

05.7 දළ ලාභය

ආදායම		53,366,645	691,848,117	79,937,031
විකුණුම් පිරිවැය	සටහන් 5.6	(49,364,301)	(570,528,814)	(632,321)
		4,002,344	**121,319,303**	**79,304,710**

මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2022	2021
	රු.	රු.
06. අනෙකුත් මෙහෙයුම් ආදායම්		
විවිධ වියදම්	**2,374,467**	-
බර කිරීම් සඳහා ආදායම	**80,700**	500
ජල ආදායම	**137,122**	225,437
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමෙන් ලද ආදායම	**327,690**	305,000
	2,919,979	530,937

මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		**2022**	2021
		රු.	රු.
07	**පරිපාලන වියදම්**		
	වැටුප් හා වේතන	**33,093,528**	29,097,372
	වැටුප් හා වේතන - සේවක අර්ථසාධක අරමුදල	**3,514,170**	3,316,401
	වැටුප් හා වේතන - සේවක භාරකාර අරමුදල	**703,243**	663,280
	අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	**684,804**	547,384
	ප්‍රසාද දීමනා, ලෙඩ නිවාඩු දීමනා	**2,232,016**	1,964,649
	කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු	**1,049,493**	813,924
	කාර්ය මණ්ඩල ය සඳහා පුහුණු වැඩසටහන්	**-**	88,500
	දුරකතන ගාස්තු	**605,067**	586,003
	තැපැල් ගාස්තු	**69,310**	85,197
	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	**721,684**	440,397
	විගණකවරුන්ගේ පාරිශ්‍රමික	**222,000**	407,000
	ව්‍යාත්තීය ගාස්තු	**531,500**	452,181
	බලපත්‍ර හා ලියාපදිංචි කිරීම්	**143,451**	216,042
	කුලී	**1,920**	1,920
	විදුලි ගාස්තු	**2,322,685**	2,546,646
	ජල ගාස්තු	**370,405**	423,625
	රක්ෂණ ගාස්තු	**1,243,363**	1,458,301
	ආරක්ෂක වියදම්	**6,462,362**	4,802,092
	වරිපනම් හා බදු	**1,416,800**	1,416,800
	වාහන නඩත්තු	**1,594,330**	706,054
	ගමන් වියදම් හා යැපුම් දීමනා	**601,808**	342,976
	පාරිතෝෂික	**2,179,992**	1,985,618
	කාර්යාල උපකරණ නඩත්තුව	**676,559**	243,643
	දායකත්ව හා චාරික	**31,090**	29,110
	රසායනාගාර වියදම්	**340,835**	300,851
	ක්ෂය කිරීම් (සටහන 13.2)	**7,336,071**	1,762,688
	වාර්ෂික සේවා ගිවිසුම්	**59,413**	169,713
	ගොඩනැගිලි හා පරිශ්‍රය නඩත්තුව	**804,391**	978,753
	පරිත්‍යාග	**-**	4,008
	ප්‍රවාහන ගාස්තු	**503,900**	103,110
	ඉන්ධන	**1,582,966**	1,054,983
	සංග්‍රහ වියදම්	**69,856**	71,757
	වාහන කුලී	**360,000**	360,000
	බර කිරීමේ ගාස්තු	**250**	1,550
	උත්සව වියදම්	**-**	6,650
	වෙළඳ දැන්වීම්	**530,494**	-
	දඩ මුදල් හා අධිභාරයන්	**-**	666
		72,059,757	57,449,844

මාර්තු **31** වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		**2022**	2021
		රු.	රු.
08	**විකුණුම් හා බෙදාහැරීමේ වියදම්**		
	වෙළඳ දැන්වීම්	**2,311,200**	711,910
	විකුණුම් ප්‍රවර්ධන	**2,018,657**	2,392,476
	වට්ටම්	**5,786,554**	2,326,873
	වෙළඳ කුටි කුලී ගාස්තු	**209,900**	9,650
	හැසිරවීමේ හා බෙදාහැරීමේ වියදම්	**781,186**	2,988,527
	ටෙන්ඩර් ගාස්තු	**2,000**	2,000
		11,109,497	8,431,436
09	**පහත සඳහන් දෑ ඇතුළුව සියලුම වියදම් අඩු කිරීමෙන් පසුව මෙහෙයුම් ලාභය සඳහන් කෙරේ.**		
	අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	**684,804**	547,384
	දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම්	**7,336,071**	1,762,688
	විගණකවරුන්ගේ පාරිශ්‍රමික	**222,000**	407,000
	පරිත්‍යාග	**-**	4,008
	වෘත්තීය හා නීති ගාස්තු	**531,500**	452,181
	කාර්ය මණ්ඩල පිරිවැය (සටහන 9.1)	**39,490,934**	35,062,671
		48,265,309	38,235,932
9.1	**කාර්ය මණ්ඩල පිරිවැය**		
	වැටුප්, වේතන හා අනෙකුත් අදාළ වියදම්	**33,093,528**	29,097,372
	නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වියදම් - සේවක ප්‍රතිලාභ	**2,179,992**	1,985,618
	නිශ්චිත දායකත්ව සැලසුම් වියදම් - සේ.අ.අරමුදල හා සේ.භා.අරමුදල	**4,217,414**	3,979,682
		39,490,934	35,062,672
10	**මූල්‍ය ආදායම**		
	ස්ථාවර තැන්පතුවලින් පොලී ආදායම	**4,357,246**	7,572,999
	භාණ්ඩාගාර බිල්පත්වලින් පොලී ආදායම	**3,100,478**	2,560,153
		7,457,723	10,133,152
11	**මූල්‍ය පිරිවැය**		
	පොල් සංවර්ධන අධිකාරියේ ණය සඳහා පොලිය	**4,011,609**	4,011,609
	කලුබෝවිටියාන ණය සඳහා පොලිය	**2,735,912**	2,735,912
	බැංකු ගාස්තු	**335,231**	65,078
		7,082,752	6,812,599
12	**ආදායම් බදු වියදම්**		
	ප්‍රවර්තන බදු වියදම්	**1,789,854**	2,431,957
		1,789,854	2,431,957
12.1	**ගිණුම්කරණ ලාභය වෙත ආදායම් බදු වියදම සැසඳුම**		
	ආදායම් බදු වියදම්වලට පෙර ලාභය	124,752,054	43,600,867
	අනෙකුත් ආදායම්/බදුවලින් නිදහස් ආදායම	(7,457,723)	(10,133,153)
	අනුමත කළ නොහැකි වියදම්	10,544,199	4,702,145
	අවසරලත් වියදම්	(2,471,267)	(1,852,495)
	වෙළඳ හෝ ව්‍යාපාරික ලාභය	125,367,263	36,317,364
	ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය	7,457,723	10,133,153
	බදු අයකළ හැකි ආදායම	132,824,986	46,450,517
	ඉදිරියට ගෙනා අලාභයෙන් අඩු කිරීම්	(125,367,262)	(36,317,366)
	බදු අයකළ හැකි ආදායම	7,457,724	10,133,151
	බදු වගකීම - 24%ක අනුපාතිකයකට	1,789,854	2,431,957
	මුළු ප්‍රවර්තන බදු ගාස්තු	1,789,854	2,431,957

13 දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය/ ප්‍රත්‍යාගණනය	2021.04.01 දිනට ශේෂය රු.	එකතු කිරීම් රු.	පැවරීම් රු.	2022.03.31 දිනට ශේෂය රු.
සින්නක්කර වත්කම්				
ඉඩම්	8,195,200,000	-		**8,195,200,000**
ගොඩනැගිලි	11,424,371	-		**11,424,371**
ගොඩනැගිලි - ආයෝජන	7,191,604	-		**7,191,604**
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	6,195,352	268,024		**6,463,375**
මෙවලම් හා උපකරණ	4,061,931	280,338		**4,342,270**
කාර්යාලීය උපකරණ	6,334,411	437,899		**6,772,310**
පිරියත හා උපකරණ	35,928,793	526,760		**36,455,553**
මෝටර් වාහන	22,018,189	21,700,000	21,689,688	**22,028,501**
	8,288,354,652	23,213,021	21,689,688	**8,289,877,985**
සමුච්චිත ක්ෂයවීම්				
සින්නක්කර වත්කම්				
ගොඩනැගිලි	8,050,582	474,973		**8,525,555**
ගොඩනැගිලි - ආයෝජන	5,100,032	359,580		**5,459,612**
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	5,882,144	232,320		**6,114,464**
මෙවලම් හා උපකරණ	2,982,724	561,386		**3,544,110**
කාර්යාලීය උපකරණ	5,573,734	559,663		**6,133,397**
පිරියත හා උපකරණ	32,473,738	751,285		**33,225,023**
මෝටර් වාහන	22,018,179	5,425,000	21,689,679	**5,753,500**
	82,081,133	8,364,207	21,689,679	**68,755,661**
කපාහැරි අගය				
සින්නක්කර වත්කම්				
ඉඩම්	8,195,200,000			**8,195,200,000**
ගොඩනැගිලි	3,373,789			**2,898,816**
ගොඩනැගිලි - ආයෝජන	2,091,572			**1,731,992**
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	313,208			**348,912**
මෙවලම් හා උපකරණ	1,079,207			**798,160**
කාර්යාලීය උපකරණ	760,678			**638,913**
පිරියත හා උපකරණ	3,455,055			**3,230,530**
මෝටර් වාහන	10			**16,275,001**
ශුද්ධ පොත් අගය	8,206,273,519			**8,221,122,324**

13.1 ඉඩම් පිළිබඳ විස්තර

2013 වර්ෂයේ දී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සමස්ත ඉඩම ප්‍රත්‍යාගණනය (අක්කර 12, රූඩ් 03 පර්චස් 8.77කළ අතර එහි අගය රු.මි.8,195ක් විය. මෙය 2021/2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල දක්වන ලදී. 15/1874/702/10 හා 16/0332/731 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව, බීසීසී ලංකා සමාගමේ ඉඩමෙන් අක්කර 06ක කොටසක් 2019 අප්‍රේල් 11 වැනි දින අධිකරණ අමාත්‍යාංශය වෙත පවරන ලදී. බීසීසී සමාගම විසින් පවරන ලද ඉඩම් කොටසට අදාළ තක්සේරු වාර්තාව ලැබුණු පසු ඉදිරි මූල්‍ය වර්ෂයේ දී අදාළ වටිනාකම මූල්‍ය ප්‍රකාශවල ඉඩම්වල වටිනාකමින් කපාහරිනු ඇත.

13.2 ක්ෂයවීම්

සමාගමේ වත්කම් කාණ්ඩ අනුව වාර්තාකරණ දිනයට සිදුකළ ක්ෂය කිරීම්වල විශ්ලේෂණය පහත පරිදි වේ.

	මුළු	නිෂ්පාදන පොදුකාර්යය	පරිපාලන වියදම්
ගොඩනැගිලි	834,553	333,821	500,732
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	232,320	-	232,320
මෙවලම් හා උපකරණ	561,386	168,416	392,970
කාර්යාලීය උපකරණ	559,663	-	559,663
පිරියත හා උපකරණ	751,285	525,900	225,386
මෝටර් වාහන	5,425,000	-	5,425,000
	8,364,207	1,028,137	7,336,071

13.3 තක්සේරු කරන ලද මෝටර්වාහනවල විස්තර

ඔටෝමෝබයිල් ඇසෝසියේෂන් ඔෆ් සිලෝන් නැමති ආයතනය විසින් 'FSV' ක්‍රමවේදය යටතේ 2022 මාර්තු 31 දිනට බීසීසී ලංකා සමාගමේ මෝටර් වාහන තක්සේරු කිරීමක් සිදුකළ අතර, එය මූල්‍ය ප්‍රකාශවල දක්වන ලදී.

ප්‍රත්‍යාගණනය කළ මෝටර්වාහනවල පොත් අගය	වාහනවල ප්‍රත්‍යාගණනය කළ අගය
21,689,688	21,700,000

14 අලෙවිය සඳහා ඇති - ආයෝජන

සමාගම	කොටස් ගණන	වෙළඳ පොළ මිල	**2022.03.31** දිනට වෙළඳ පොළ අගය රු.	**2021.03.31** දිනට වෙළඳ පොළ අගය රු.
සිලෝන් හොටෙල් කෝපරේෂන්	10,000	24.00	**240,000**	240,000

15 භාණ්ඩ තොග			
අමුද්‍රව්‍ය හා පරිභෝජ්‍ය භාණ්ඩ	(15.1)	**48,856,146**	31,432,494
නිමි භාණ්ඩ	(15.2)	**10,534,001**	17,885,925
		59,390,147	49,318,419
15.1 අමුද්‍රව්‍ය හා පරිභෝජ්‍ය භාණ්ඩ			
සබන්		**14,075,644**	**17,854,436**
පිරිපහදුව		**34,399,186**	**13,196,741**
පිප්ප අංශය		**381,316**	**381,316**
		48,856,146	**31,432,493**
15.2 නිමි භාණ්ඩ			
සබන්		**6,692,833**	**5,725,681**
පිරිපහදුව		**3,841,168**	**12,160,244**
		10,534,001	**17,885,925**

මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		2022 රු.	2021 රු.
16 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ			
වෙළඳ ණයගැතියෝ	**16.1**	**138,370,326**	42,469,849
තැන්පත්, අත්තිකාරම් හා පෙර ගෙවීම්	**16.2**	**2,928,895**	3,827,068
අනෙකුත් ලැබිය යුතු දෑ	**16.3**	**19,333,577**	14,968,317
කාර්ය මණ්ඩල ණය	**16.4**	**1,491,250**	975,000
		162,124,049	62,240,234
16.1 වෙළඳ ණයගැතියෝ			
බෙදා හැරීම් ණයගැතියෝ		**16,457,089**	9,687,249
සෘජු ගැනුම්කරුවන්		**93,224,174**	17,066,374
ආයතනික ණයගැතියෝ		**35,776**	35,776
ආයතනික ණයගැතියෝ - සම්බන්ධිත පාර්ශව	(16.1.1)	**26,469,313**	12,728,269
ගල්තාර ණයගැතියෝ		**90,105**	90,105
රජයේ ණයගැතියෝ - සම්බන්ධිත පාර්ශව	(16.1.1)	**2,400,241**	3,185,785
		138,676,697	42,793,558

16.1.1 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම්

සමාගම විසින් සිය සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල (LKAS 24) සම්බන්ධිත පාර්ශව ලෙස අර්ථ දක්වා ඇති පාර්ශව සමඟ ගනුදෙනු සිදුකරනු ලැබේ.

එම විස්තර පහත දැක්වේ.

වෙළඳ ණයගැතියෝ - සම්බන්ධිත පාර්ශව

සංස්ථා ණය ගැතියෝ		
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	**109,197**	435,349
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	**16,692**	2,925,434
ලංකා විදුලිබල මණ්ඩලය	**-**	62,401
ලංකා පොහොර සමාගම	**44,947**	80,006
ලංකා සතොස සමාගම	**25,279,493**	3,302,992
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	**79,020**	
රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව	**939,964**	5,922,087
	26,469,313	12,728,269
රජයේ ණය ගැතියෝ		
ශ්‍රී ලංකා ගුවන් හමුදා සුබසාධන සංගමය	**33,945**	33,945
ශ්‍රී ලංකා නාවික හමුදාව	**21,762**	21,762
ශ්‍රී ලංකා පදනම් ආයතනය	**353,760**	300,630
ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල	**436,700**	120,010
රිජ්වේ ආර්යා ළමා රෝහල	**4,628**	4,628
වෛද්‍ය සැපයුම් අංශය	**5,670**	279,671
සෞඛ්‍ය අමාත්‍යාංශය	**219,025**	8,028
මහනගර සභාව - ශ්‍රී ජයවර්ධනපුර	**100,799**	-
ආරක්ෂක අමාත්‍යාංශය	**17,998**	-
විශේෂ කාර්යබලකා මූලස්ථානය	**21,406**	21,406
දන්ත සෞඛ්‍ය ආයතනය	**92,594**	-
හෝමාගම රෝහල	**46,500**	46,500
ජනාධිපති කාර්යාලය	**-**	17,500
ශික්ෂණ රෝහල -රාගම	**-**	64,396
අවිස්සාවේල්ල රෝහල	**1,000**	1,000
කර්මාන්ත අමාත්‍යාංශය	**-**	5,760
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	**-**	353,094
නාගරික කාර්යාලය - දෙහිවල	**-**	150,793
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	**-**	15,601
විභාග දෙපාර්තමේන්තුව	**-**	203,056
ජාතික අක්ෂි රෝහල	**-**	156,006
ශික්ෂණ රෝහල - කරාපිටිය	**-**	200,016
ද සොයිසා කාන්තා රෝහල	**43,141**	-
ක්ෂය රෝග පාලනය හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන	**49,680**	-
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - අංගොඩ	**869,940**	-
පේරාදෙණිය ශික්ෂණ රෝහල	**-**	806,987
සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල	**-**	374,998
පවුල් සෞඛ්‍ය කාර්යාංශය	**17,296**	
අපේක්ෂා රෝහල - මහරගම	**64,396**	
	2,400,241	3,185,787

මාර්තු **31** වන දිනට		**2022**	2021
		රු.	රු.
16.1.2	**අඩමාණ වෙළඳ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන**		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**323,709**	383,709
	බොල් හා අඩමාණ ණය ලැබීම්	**(17,338)**	(60,000)
	වසර අවසාන ශේෂය	**306,371**	323,709
	වෙළඳ ණයගැතියෝ - ශුද්ධ	**138,370,326**	42,469,849

16.1.3 වෙළඳ ණයගැතියන්ගේ කාල විශ්ලේෂණය පහත පරිදි වේ.

	මාස 0 - 03	**මාස 03-12**	**මාස 12ට වැඩි**	**එකතුව**
බෙදාහරින්නන්	16,469,647		(12,558)	16,457,089
සෘජු ගැනුම්කරුවන්	72,522,559	20,568,074	133,542	93,224,176
සංස්ථා	9,048,180	15,721,106	1,735,801	26,505,087
ගල්තාර			90,105	90,105
රජය	1,221,352	1,035,951	142,939	2,400,241
	99,261,738	37,325,131	2,089,829	138,676,697

16.1.4	**බොල් හා අඩමාණ ණය ගැතියන් සඳහා වෙන්කිරීම**	
	බෙදාහරින්නන්	12,150
	සෘජු ගැනුම්කරුවන්	85,839
	සංස්ථා	52,467
	කුලී	72,978
	රජය	82,938
	එකතුව	306,372

මාර්තු **31**වන දිනට		**2022**	2021
		රු.	රු.
16.2	**තැන්පතු, අත්තිකාරම් හා පෙර ගෙවීම්**		
	මිලදී ගැනුම් අත්තිකාරම්	**1,420,474**	2,503,673
	කාර්ය මණ්ඩල සුබසාධන පෙර ගෙවීම්	**-**	45,500
	වාර්ෂික සේවා පෙර ගෙවීම්	**33,817**	41,230
	රක්ෂණ පෙර ගෙවීම්	**489,490**	384,435
	මුදලින් සිදුකළ අලෙවි	**29,020**	-
	ලංසු තැන්පතු	**15,000**	722,800
	විවිධ තැන්පතු	**596,728**	654,628
	සුබසාධන අලෙවිසැල	**(1,019)**	(915)
	රජවාස අලෙවිසැල	**87,111**	92,349
	එකතුකළ අගය මත බදු ලැබිය යුතු	**690,389**	161,022
	බලපත්‍ර හා ලියාපදිංචි කිරීම් පෙර ගෙවීම්	**1,282**	4,332
	ලැබිය යුතු පොලී	**987,077**	638,488
		4,349,369	5,247,542

16.2.1	**අඩමාන අත්තිකාරම් සඳහා වෙන් කිරීම්**		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**1,420,474**	1,420,474
	වර්ෂය සඳහා ප්‍රතිපාදන / (ප්‍රතිවර්තන)	**-**	-
	වර්ෂය තුළ කපා හැරීම්	**-**	-
	වසර අවසාන ශේෂය	**1,420,474**	**1,420,474**
	තැන්පතු, අත්තිකාරම් හා පෙර ගෙවීම් - ශුද්ධ	**2,928,895**	**3,827,068**

මාර්තු **31**වන දිනට		**2022**	2021
		රු.	රු.
16.3	**අනෙකුත් ලැබිය යුතු**		
	ලැබිය යුතු කුලී ආදායම් - සම්බන්ධිත පාර්ශව (සටහන: 16.3.1)	**5,306,200**	14,906,828
	ලැබිය යුතු කුලී ආදායම් - සම්බන්ධිත නොවන පාර්ශව	**14,027,377**	-
		19,333,577	14,906,828
16.3.1	**ලැබිය යුතු කුලී ආදායම් - සම්බන්ධිත පාර්ශව**		
	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	**2,471,939**	2,075,450
	ලංකා සිමෙන්ති සමාගම	**1,120,111**	1,120,111
	ලංකා සිමෙන්ති සංස්ථාව	**886,150**	886,150
	පොල් සංවර්ධන අධිකාරිය	**828,000**	828,000
		5,306,200	4,909,711

16.3.2 ලැබිය යුතු කුලී ආදායමේ කාල විශ්ලේෂණය

	මාස 0 - 03	**මාස 03-12**	**මාස 12ට වැඩි**	**එකතුව**
ලැබිය යුතු කුලී ආදායම්	**15,170,210**	**1,334,519**	**2,828,849**	**19,333,577**

මාර්තු **31**වන දිනට		**2022**	2021
		රු.	රු.
16.4	**කාර්ය මණ්ඩල ණය**		
	උත්සව අත්තිකාරම් - වැටුප්	**823,125**	575,000
	උත්සව අත්තිකාරම් - වෙතන	**668,125**	400,000
		1,491,250	975,000
17	**ප්‍රවර්තන බදු වත්කම්**		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**3,523,850**	5,955,807
	වර්ෂය තුළ හිමිකම	**(1,789,854)**	(2,431,957)
	වසර අවසාන ශේෂය	**1,733,996**	3,523,850
18	**මුදල් හා මුදල් සමාන දෑ**		
	මහජන බැංකුව - 0056100163078093	**34,637,698**	28,555,689
	මහජන බැංකුව - 004100170002337	**83,325**	-
	අතැති මුදල්	**217,000**	217,000
	කෙටි කාලීන ආයෝජන -මහජන බැංකුව (සටහන 18.1)	**187,756,367**	175,981,274
	මුදල් ප්‍රවාහ සඳහා මුදල් හා මුදල් සමාන දෑ	**222,694,390**	204,753,963
18.1	**කෙටිකාලීන ආයෝජන - මහජන බැංකුව**		
	ස්ථාවර තැන්පතු අංකය - 00002289 - 7	**36,174,111**	34,506,385
	ස්ථාවර තැන්පතු අංකය - 00002290 - 4	**-**	23,004,257
	ස්ථාවර තැන්පතු අංකය - 00002396 - 7	**-**	21,722,370
	ස්ථාවර තැන්පතු අංකය - 00003021- 8	**8,220,857**	7,846,526
	ස්ථාවර තැන්පතු අංකය - 00003063- 7	**8,209,487**	7,831,007
	ස්ථාවර තැන්පතු අංකය - 00003315- 3	**15,718,295**	14,969,805
	ස්ථාවර තැන්පතු අංකය - 3697-1	**6,402,702**	6,083,328
	ස්ථාවර තැන්පතු අංකය - 3698-0	**6,402,702**	6,083,328
	භාණ්ඩාගාර බිල්පත - 01	**12,183,520**	11,620,023
	භාණ්ඩාගාර බිල්පත - 02	**11,838,920**	11,291,364
	භාණ්ඩාගාර බිල්පත - 03	**22,042,513**	21,022,975
	භාණ්ඩාගාර බිල්පත - 04	**10,563,417**	9,999,907
	භාණ්ඩාගාර බිල්පත - 05	**19,999,935**	-
	භාණ්ඩාගාර බිල්පත - 06	**14,999,987**	-
	භාණ්ඩාගාර බිල්පත - 07	**14,999,921**	-
		187,756,367	175,981,275

සමාගම විසින් පිළිගත් බැංකුවල මුදල් හා මුදල් සමාන දෑ පවත්වා ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		2022	2021
		රු.	රු.
19	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	සාමාන්‍ය කොටස් 10,000,000 ක් නිකුත් කර සම්පූර්ණයෙන් ගෙවා තිබේ.	**100,000,000**	100,000,000
		100,000,000	100,000,000
20	**ප්‍රාග්ධන සංචිත**		
	ප්‍රත්‍යාගණනිත සංචිතය	**8,215,475,600**	8,193,775,600
		8,215,475,600	8,193,775,600
21	**විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්**		
	නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන අගයේ විචලනය		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**11,718,836**	9,857,398
	ප්‍රවර්තන සේවා පිරිවැය	**1,114,523**	1,237,702
	පොලී පිරිවැය	**1,065,469**	747,915
	බැඳීම් මත ආයුගණක (ලැබීම්)/හානි	**(1,575,720)**	301,870
	ප්‍රතිලාභ ගෙවීම්	**(869,518)**	(426,050)
	වසර අවසාන ශේෂය	**11,453,590**	11,718,835

2022 මාර්තු 31 වන දිනය විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීම සිදුකරන ලද්දේ සමාගම විසින් සිදුකළ ආයුගණක ඇගයීමක් පාදක කරගෙන ය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල (LKAS 19) සේවක ප්‍රතිලාභවල දක්වා 'ඇති 'PUC' ක්‍රමවේදය අනුව ඇගයීම සිදුකර ඇත.

21.1	**ආයුගණක උපකල්පන**	**2022**	2021
	වාර්තාකරණ දිනයට මූලික ආයුගණක උපකල්පන		
	වට්ටම් අනුපාතිකය	**10%**	10%
	අනාගත වැටුප් වැඩිවීම්	**10%**	10%
	විශ්‍රාමික වයස (අවුරුදු)	**62**	60

22	**ණය හා ණය ගැනීම්**		
	පොල් සංවර්ධන අධිකාරිය	**111,418,856**	107,407,247
	එකතු කළා: 2021/22 තුළ ප්‍රාග්ධනිත පොළිය	**4,011,609**	4,011,609
		115,430,465	111,418,856
	සී/ස කලුබෝවිටියාන තේ සමාගම	**58,382,429**	55,646,517
	එකතු කළා: 2021/22 තුළ ප්‍රාග්ධනිත පොළිය	**2,735,912**	2,735,912
		61,118,341	58,382,429
		176,548,806	**169,801,285**

22.1 කලුබෝවිටියාන

2021 සැප්තැම්බර් 21 දිනැති අංක BCC/2021/BP-105 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් සී/ස කලුබෝවිටියාන තේ සමාගම වෙත දිගු කාලයක් ඇණහිටි ඇති ණය මුදල පියවා දැමීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් අනුමත කර තිබේ.

මාර්තු 31 දිනට			**2022**	2021
			රු.	රු.
23	**වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු**			
	වෙළඳ ණය හිමියෝ	23.1	**11,946,208**	22,757,992
	උපචිත වියදම්	23.2	**2,318,807**	4,866,758
	අනෙකුත් ගෙවිය යුතු	23.3	**58,984,600**	59,311,086
	ගෙවිය යුතු තැන්පතු	23.4	**19,742,598**	17,821,650
			92,992,214	104,757,486
23.1	**වෙළඳ ණය හිමියෝ**			
	තෙල්	23.1.3	**(0.00)**	4,486,786
	සබන්	23.1.4	**2,687,632**	9,555,089
	පිරිපහදු		**4,748,990**	4,065,263
	පවිත්‍රකාරක		**(0.00)**	142,158
	විවිධ		**891.00**	-
	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	23.1.1	**4,508,696**	4,508,696
			11,946,208	**22,757,992**
23.1.1	**වෙළඳ ණය හිමියෝ - සම්බන්ධිත පාර්ශව**			
	පරන්තන් කෙමිකල්ස් කම්පැණි		**-**	**3,612,661**
	ජනතා වතු සංවර්ධන මණ්ඩලය		**4,508,696**	**4,508,696**
			4,508,696	**8,121,357**

23.1.2 වෙළඳ ණය හිමියන්ගේ කාල විශ්ලේෂණය පහත පරිදි වේ.

	මාස 0 - 03	**මාස 03- 12**	**මාස 12ට වැඩි**	**එකතුව**
සබන්	**823,914**		**1,863,718**	**2,687,632**
පිරිපහදු	**1,735,631**		**3,013,359**	**4,748,990**
විවිධ		**891**		**891**
ජනතා වතු සංවර්ධන මණ්ඩලය			**4,508,696**	**4,508,696**
	2,559,545	**891**	**9,385,773**	**11,946,209**

23.1.3 තෙල් - ණය හිමියෝ

2021 සැප්තැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විජිත ඔයිල් මිල්ස් වෙත ගෙවිය යුතු රු.3,079,850 ක මුදල හා අජන්තා ඔයිල් මිල්ස් වෙත ගෙවිය යුතු රු. 1,406,936ක මුදල පියවීම අනුමත කරන ලදී.

23.1.4 සබන් - ණය හිමියෝ

2022 ජනවාරි 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරන්තන් කෙමිකල්ස් කම්පැණි වෙත ගෙවිය යුතුව පැවති රු.3,612,661.31 ක් ගෙවීම අනුමත කරන ලද අතර 2022 මාර්තු 01වන දින එය පියවන ලදී.

මාර්තු 31 දිනට		**2022**	2021
		රු.	රු.
23.2	**උපචිත වියදම්**		
	ආරක්ෂක ගාස්තු	**633,284**	438,078
	ව්‍යාත්තීය ගාස්තු	**69,485**	58,617
	ජල ගාස්තු	**33,215**	24,498
	දුරකතන ගාස්තු	**90,781**	81,055
	විගණන ගාස්තු	**222,000**	654,000
	ලෙඩ නිවාඩු ප්‍රසාද දීමනා	**-**	1,285,899
	වේතන -සබන් විවිධ	**853,631**	925,702
	තැපැල් හා මුද්දර ගාස්තු	**4,900**	4,225
	විවිධ දීමනා	**-**	839,200
	වාහන කුලී	**-**	30,000
	විදුලි ගාස්තු	**411,032**	384,324
	කාර්යාල උපකරණ	**-**	115,000
	රසායනාගාර වියදම්	**-**	26,160
	කුලිය	**480**	-
		2,318,807	4,866,758

මාර්තු 31 වන දිනට		**2022**	2021
		රු.	රු.
23.3 අනෙකුත් ගෙවිය යුතු			
පිරිවැටුම් බදු		**141,280**	141,280
ආරක්ෂක බද්ද - (NSL)		**1,079,762**	1,079,762
එකතු කළ අගය මත බදු		**34,154,829**	34,187,473
භාණ්ඩ හා සේවා බද්ද (G.S.T)		**1,279,509**	1,279,509
වරිපනම් හා බදු	(23.3.1)	**-**	21,608,510
වැටුප් හා වේතන - බාහිර ණය		**17,604**	1,823
ගෙවිය යුතු මුද්දර ගාස්තු		**3,850**	3,625
ගෙවිය යුතු වැටුප් හා වේතන		**367,119**	248,000
සේවක අර්ථසාධක අරමුදල		**260,311**	230,134
සේවක භාරකාර අරමුදල		**71,825**	71,659
රඳවාගැනීම්		**-**	197,000
කලින් ලද ආදායම්		**-**	262,310
ඉඩම් අත්පත් කරගැනීමේ වන්දි වශයෙන් අත්තිකාරම්	(23.3.1)	**21,608,510**	-
		58,984,600	59,311,085

23.3.1 වරිපනම් හා බදු

කොළඹ අධිකරණ චතුරස්‍රය ඉදිකිරීම සඳහා සමාගම වෙතින් අත්පත්කරගත් ඉඩම සඳහා ගෙවිය යුතු හිඟහිටි වරිපනම් හා බදු ගාස්තු රු.21,608,510ක් වන අතර එම මුදල අධිකරණ අමාත්‍යාංශයෙන් 2021.09.02 වන දින ගෙවා ඇති අතර, ඉඩම් අත්පත්කරගැනීමේ වන්දි මුදලින් ප්‍රතිපූරණය කළ යුතුව ඇත.

මාර්තු 31 වන දිනට	**2022**	2021
	රු.	රු.
23.4 ගෙවිය යුතු තැන්පතු		
කුලී තැන්පතු	**19,060,298**	17,539,350
සැපයුම් තැන්පතු	**642,300**	242,300
සේවක තැන්පතු	**40,000**	40,000
	19,742,598	17,821,650

24 විලම්බිත බදු වත්කම් හා වගකීම්

24.1 විලම්බිත බදු වත්කම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්	1,603,502	-
බදු හානි	4,666,066	
ණයගැතියන් සඳහා වෙන්කිරීම්	42,892	
	6,312,460	
24.2 විලම්බිත බදු වගකීම්		
දේපළ, පිරියත හා උපකරණ	510,206	
මෝටර් වාහන ප්‍රත්‍යාගණනය	1,358,000	
	1,868,206	
විලම්බිත බදු (ආදායම)/වියදම	(4,444,254)	